* සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න. නම :......................................

එච්. ඒ. කරුණාරත්න (1929)

- එච්. ඒ. කරුණාරත්න මහතා ශ්‍රී ලංකාවේ නූතන චිත්‍ර කලාවේ නව සම්ප්‍රදායක් වන වියුක්ත කලා සම්ප්‍රදාය බිහි කිරීමට පුරෝගාමී වූ විශිෂ්ට නිර්මාණ ශිල්පියා ලෙස හැඳින්විය හැකි ය.
- දේශීය වශයෙන් හා ජාත්‍යන්තර වශයෙන් ද සම්මානනීයත්වයට පත් එච්. ඒ කරුණාරත්නයන් වර්ෂ 1929 බණ්ඩාරගම ප්‍රදේශයේ දී උපත ලැබීය.
- 1952 රජයේ ලලිත කලා ආයතනයේ චිත්‍ර කලාව හදාරණ ලද එච්. ඒ කරුණාරත්න මහතා පසුකාලීන ව එහි කථිකාචාර්යවරයකු ලෙස සේවය කර ඇත.
- ඔහුගේ නිර්මාණකරණ ක්‍රියාවලිය සඳහා ජපන් හා ඇමරිකානු චිත්‍ර කලා අධ්‍යාපනයෙන් ලද පාඩම් මහත් ආභාසයක් වී ඇත.
- ශ්‍රී ලංකාවේ නූතන කලාවේ නිරූපණාත්මක සංරචනය වෙනුවට ඇමරිකානු වියුක්ත ප්‍රකාශනවාදී (Abstract Expressionism) චිත්‍ර ශෛලියට අනුගත වූ වියුක්ත චිත්‍ර කලා භාෂාවක් ස්ථාපිත කරන ලදි.
- ඔහුගේ නිර්මාණශීලි චිත්‍ර ශෛලියෙහි මධ්‍යගත සංරචනයක් නොමැති අතර තලය පුරා හැඩතල විසුරුවා හරින සංරචනයක් පෙන්වයි.
- එච්. ඒ. කරුණාරත්නයන් පසුකාලීන සිය නිර්මාණ සඳහා තේමාවක් සපයන්නේ නැත. එමගින් ඔහු, නරඹන්නාට සිතීමට අවස්ථාව දී තිබේ.
- ඔහුගේ නිර්මාණයන්ගෙන් ආගමික හැඟීම් සහිත වූ ශාන්ත රසයක් ජනිත කරවන බව කලා විචාරක මතයයි.
- මුල් කාලීන ව තෙල් සායම් මාධ්‍යයෙන් කැන්වසය මත චිත්‍ර සංරචනය කළ ඔහු පසුකාලීන ව එකිනෙකට වෙනස් මාධ්‍ය භාවිත කරන ලදී.
- සිය නිර්මාණයන්ගේ ත්‍රිමාන බව තීව්‍ර කිරීමට ඇණ, කාඩ්බෝඩ් නූල් වැනි විවිධ ද්‍රව්‍ය භාවිතයෙන් උත්සාහ කර ඇත. එමගින් නිර්මාණයේ එකිනෙක විරුද්ධ මතුපිට ස්වභාවයන්ගෙන් (texture) විවිධ රසයන් ජනිත කරයි.
- ඔහුගේ නිර්මාණ අතර දැකිය හැකි සුවිශේෂ නිර්මාණ කිහිපයක් පහත දැක්වේ.

මුල්කාලීන නිර්මාණ කැන්වසය මත තෙල් සායම් මාධ්‍යයෙන් කරන ලද නිර්මාණ

- සඳපායා	- සුදු වලාකුළු
- චන්ද්‍රකාන්ත පාෂාණය	- මලෙක සුවඳ
- මල් සුවඳ	- අස්වැන්න ආදී සිතුවම්

පසුකාලීන නිර්මාණ - විවිධ මාධ්‍ය භාවිතයෙන් සිදුකරන ලද නිර්මාණ (Assemblage Art)

සඳපායා

- එච්. ඒ. කරුණාරත්න ශිල්පියා විසින් 1980 දශකය තුළ නිර්මාණය කරන ලද මෙම සිතුවම '' සඳපායා '' නම් වේ.
- තෙල් සායම් මාධ්‍යයෙන් කැන්වසය මත කරන ලද මෙම සිතුවම ඔහුගේ මුල් කාලීන නිර්මාණයකි.
- මෙම සිතුවමේ මධ්‍යගත සංරචනයක් දක්නට නොමැති අතර, තලය පුරා හැඩතල විසුරුවා හරින සංරචනයක් පෙන්වයි.
- වියුක්ත ප්‍රකාශනවාදි කලා ලක්ෂණ ඔහුගේ මෙම නිර්මාණය සඳහා පදනම් වී ඇත.
- ස්වභාව ධර්මයේ නිශ්චිත අවස්ථාවක් චිත්‍රයේ ප්‍රකාශනය සඳහා වස්තු විෂය කර ගැනීම මින් පෙන්වයි.
- වියුක්ත ප්‍රකාශනවාදී කලා ලක්ෂණ අනුව පවතින රූපිත සැලැස්මේ සැබෑ ස්වරූපයෙන් නොපෙන්වීම හා අභ්‍යන්තර හැඟීම් අනුව ස්වභාවය නිරූපණය කිරීම මෙයින් දක්වයි.
- අහසේ පායන ලද සඳ හා එම සඳ කිරණ වැටුණු ගස්වල චමත්කාරජනක හැඟීම් මතු කිරීම සඳහා නිර්මාණයේ දීප්තිමත් මුහුන් වර්ණ, රේඛා හා හැඩතල භාවිත කර ඇත.
- මෙම නිර්මාණයෙන් ආගමික හැඟීම් සහිත වූ ශාන්ත රසයක් ජනිත කරවන බව කලා විචාරක මතයයි.

1. මෙය හැඳින්වනුයේ ....

2. ශිල්පියා ....

3. මාධ්‍යය ....

4. වර්ණ භාවිතය ....

5. හැඟීම් ප්‍රකාශනය ....

''නම් නොකළ'' Untitled

- එච්. ඒ. කරුණාරත්න ශිල්පියා විසින් මෑතකාලයේ දී එනම් 2011 වසරේ දී නිර්මාණය කරන ලද මෙම නිර්මාණය ''නම් නොකළ'' නමින් හැඳින්වේ.
- මෙය මූර්තිමය ලක්ෂණ දැකිය හැකි එකලස් කිරීමේ ශිල්ප ක්‍රමය අනුව කරන ලද නිර්මාණයකි.
- මෙම නිර්මාණය කිරීම සඳහා තහඩු, කම්බි, ඇණ යනාදි මිශ්‍ර මාධ්‍ය භාවිත කර ඇත.
- මේ සඳහා ඝන හා රළු අමුද්‍රව්‍ය නිරූපණාත්මක අරමුණක් වෙනුවෙන් භාවිත කර තිබීම මෙම නිර්මාණයේ ඇති සුවිශේෂ ලක්ෂණයකි.
- මෙම නිර්මාණය සඳහා විස්තරාත්මක බවින් අඩු, එසේ ම යෝගී ඉරියව්වක දැකිය හැකි මූලික ලක්ෂණ සහිත හැඩතල අනුව කළ නිර්මාණයක් වශයෙන් සැලකිය හැකි ය.
- සරල බව හා සංකේතාත්මක බව නිර්මාණාත්මක ව ඉදිරිපත් කළ කෘතියකි.
- සංස්ලේෂණාත්මක ඝනිකවාදය හා එක්කාසු කලාවේ ආභාස ලක්ෂණ මෙම නිර්මාණය ආශ්‍රිත ව දැකිය හැකි වේ.

6. ශිල්පියා ....

7. මේ මඟින් නිරූපණය වනුයේ ....

8. මාධ්‍යය ....

9. ශිල්ප ක්‍රමය ....

10. ආභාසය ....